# 6 සුහද කතා



| | | |
|---|---|---|
| සමන් | : | ජගත්, ඔයා අද හුඟක් වේලාසනින් නේ. |
| ජගත් | : | ඔව්, අද මම ටිකක් කලින් තමයි. |
| සමන් | : | බලන්න, කපිල ආවෙ නැහැනේ තාමත්. |
| ජගත් | : | කපිල ඊයේ නෑදෑ ගෙදරක ගියා ලු. |
| සමන් | : | කා එක්ක ද? |
| ජගත් | : | තාත්තාත් එක්ක ලු ගියේ. |
| සමන් | : | අර එන්නෙ කියන කොට ම. |
| ජගත් | : | සුබ උදෑසනක් කපිල. |
| කපිල | : | සුබ උදෑසනක් දෙන්නට ම. |
| සමන් | : | ඔයා ඊයේ නෑ ගෙදරක ගියා ලු නේ ද? |
| කපිල | : | ඔව් සමන්. මට තාත්තත් එක්ක යන්න වුණා. |
| ජගත් | : | ඊයෙ හරි ම වටිනා දවසක් |

කපිල : මට ආරංචියි. මත්ද්‍රව්‍ය ගැන ඊයෙ හොඳ දේශනයක් තිබුණ ලු ප්‍රධාන රැස්වීමේ දී නේ ද?

සමන් : ඔව්, මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම ගැන.

ජගත් : පොලිස් අධිකාරිතුමා හොඳ උපදෙස් ටිකක් දුන්නා.

කපිල : මට එන්න බැරි වුණානෙ. මොනව කරන්න ද? ඔය දෙන්නා මට කියල දෙන්නකෝ.

ජගත් : අපට නොගැළපෙන යාළුවො ඇසුරු කරන්න එපා. අඳුනන්නෙ නැති අය දෙන පාර්සල් බාර ගන්න එපා.

කපිල : ඇයි ඒ ?

ජගත් : ඒ පාර්සල් ඇතුළෙ මත්ද්‍රව්‍ය තියෙන්න පුළුවන්. ඒක කාට හරි ගිහින් දෙන්න කියල අපට දුන්නොත් අපි ඒක අරගෙන ඒ කිව්ව එක්කෙනාට ගිහින් දෙනව කියමුකෝ. එතකොට දන්නෙ ම නැති ව අපි මත්ද්‍රව්‍ය වාහකයො වෙනව ලු.

කපිල : වෙන මොනව ද කිව්වෙ ?

සමන් : හිතවත් කමක් නැති අය දෙන ටොෆි, චොකලට් වගේ දේවල් කන්න එපා. නාඳුනන අය එක්ක ගමන් බිමන් යන්න එපා කිව්වා.

ජගත් : විදුහල්පතිතුමා කිව්වා මේ උපදෙස්වලින් පෝස්ටර් කීපයක් හදන්න කියලා.

කපිල : ඒ මොකට ද?

සමන් : දැනුවත් කිරීම් පුවරුවේ ප්‍රදර්ශනය කරන්න.

කපිල : ඔයාලා පෝස්ටර් හැදුවා ද?

ජගත් : තාම නැහැ. අපි එකතුවෙලා හදමු.

## ක්‍රියාකාරකම : 1

චරිත බෙදා ගෙන මෙම සංවාදය පන්තියට ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම : 2

පාසල අවසන් වී නිවසට ගිය පුතා මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම පිළිබඳ පැවති දේශනය ගැන මවට විස්තර කරයි. මෙහිදී මව හා පුතා අතර ඇතිවන කතා බහ දෙබසක් ලෙසින් පන්තියට ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම : 3

දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම සඳහා මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම පිළිබඳ උපදෙස් පත්‍රිකාවක් සකස් කර එය පන්තියට ඉදිරිපත් කරන්න.

## ක්‍රියාකාරකම : 4

උදහරණය බලා වගුව සම්පූර්ණ කරන්න.

| අ | ආ |
|---|---|
| ✸ අපට නොගැළපෙන යාළුවො ඇසුරු කරන්න එපා. | ✸ අපට නොගැළපෙන අය ඇසුරු කිරීමෙන් වළකින්න.<br>✸ අපට නොගැළපෙන යහළුවන්ගෙන් ඈත් වන්න. |
| ✸ අඳුනන්නෙ නැති අය දෙන පාර්සල් භාර ගන්න එපා. | ✸<br>✸ |
| ✸ හිතවත්කමක් නැති අය දෙන ටොෆි චොකලට් වගේ දේවල් කන්න එපා. | ✸<br>✸ |
| ✸ නාඳුනන අය එක්ක ගමන් බිමන් යන්න එපා. | ✸<br>✸ |

## ක්‍රියාකාරකම : 5

පහත දැක්වෙන වාක්‍ය කියවා වෙනත් කෙනකු කියූ දෙයක් ප්‍රකාශ කරන ආකාරයේ ඇති වෙනස හඳුනා ගනිමු.

| අ | ආ |
|---|---|
| ✸ කපිල ඊයේ නෑදෑ ගෙදරක ගියා. | ✸ කපිල ඊයේ නෑදෑ ගෙදරක ගියා ලු. |
| ✸ ඔයා ඊයේ නෑදෑ ගෙදරක ගියා නේ ද? | ✸ ඔයා ඊයේ නෑදෑ ගෙදරක ගියා ලු නේ ද? |
| ✸ ඊයේ හොඳ කතාවක් තිබුණා නේ ද? | ✸ ඊයේ හොඳ කතාවක් තිබුණා ලු නේ ද? |
| ✸ මත්ද්‍රව්‍ය වාහකයෝ වෙනවා. | ✸ මත්ද්‍රව්‍ය වාහකයෝ වෙනවලු. |

පහත දක්වෙන වාක්‍ය වාර්තා කිරීමේ ආකාරයට ලියන්න.

නිදසුන : මල්ලී ඊයේ ගෙදර ගියා.
මල්ලී ඊයේ ගෙදර ගියා ලු.

i. මල් ප්‍රදර්ශනය හරි ම ලස්සනයි.
ii. නැටුම් තරගයේ දී නංගී ඉතා හොඳින් නැටුවා.
iii. පසුගිය සතියේ රත්නපුරයට ගංවතුර ගැලුවා.
vi. ක්‍රීඩා උත්සවය ජයට පැවැත්වෙනවා.
v. ලබන මාසයේ පාසලේ ශ්‍රමදානයක් පවත්වනවා.

## ක්‍රියාකාරකම : 6

වචන ගළපා වාක්‍ය ලියන්න.

i. ගැනීමට / කියවන්න / දැනුම / පොත් / ලබා
ii. පැමිණෙන්න / වේලාසනින් / පාසලට
iii. පෙර / සෝදන්න / අත් / කෑමට
iv. වැඩිහිටියන්ට / වෙන්න / කීකරු
v. මාරු / පරිස්සමින් / වෙන්න / පාර